# Buddhist Attitude to Suicide

# A correction of a classical error in translation.

*පූජ්‍ය මහාචාර්ය ධම්මවිහාරී හිමිපාණෝ*

න ච භික්ඛවේ අත්තානං පාතෙතබ්බං
යො පාතෙය්‍යා ආපත්ති දුක්කටස්ස.
පාරාජිකාපාළි

මෙය වූ කලී බෞද්ධ භික්ෂුවට
සිය දිවි නසාගැනීමට මග පෑදීමක් ද?

මෙම ලිපිය මූලික වශයෙන් කොටස් දෙකකට බෙදී ලියැවේ. පළමුවෙන් ම බුදුන් වදාළ නෛර්‍යාණික (නිවන කරා මිනිසා ගෙන යන) ධර්මය තුළ මිනිසා තමන් වසන සෙසු ලෝකය දෙස බැලිය යුතු ආකාරය මෙන් ම එය තුළ පැවැතිය යුතු ආකාරය පෙළ දහම ඇසුරෙන් වටහා ගැනීමට උත්සාහ දරමු. දෙවනුව ධර්මය තුළින් පැහැදිලි වන අදහස්වලට අනුව මිනිසා නිවන කරා යෑම සඳහා (තම දිවිය) සකසා ගතයුතු අයුරු විමසා බැලීමට වෑයම් කරමු.

බුදුරදුන් වැඩ වසන කල්හිදු උන්වහන්සේ වදාළ ධර්මය විවිධ අවස්ථාවල ශ්‍රාවකයින් විසින් විපරීත ලෙස ඉදිරිපත් කර ඇති බව දක්නට ලැබේ. මෙයට හේතු වූයේ දුග්‍රාහය නොහොත් වරදවා තේරුම් ගැනීම යයි බුදුරදුන් විසින් ම පෙන්වා දී ඇත. මේ පිළිබඳ නිදසුන් පෙළ පොත්වලින් අපමණ ගෙන හැර දැක්විය හැකි ය. මජ්ඣිම නිකායෙහි අලගද්දූපම සූත්‍රයේ දැක්වෙන පරිදි අරිට්ඨ නම් භික්ෂුව බුදුබණ වැරැදි ලෙස වටහා ගෙන බුදුන් අන්තරායකර යයි වදාළ ඇතැම් දේ එසේ නොවේ යයි කියන්නට පටන් ගත්තේ ය. එපරිද්දෙන් ම මජ්ඣිම නිකායේ ම මහා තණ්හා සංඛය සූත්‍රයෙහි සාති භික්ෂුව විඤ්ඤාණය පිළිබඳ බුදුන් වදාළ ධර්මය විපරීත කොට දක්වයි. මේ සෑම අවස්ථාවක දී ම බුදුරදුන් වැරැදිකරු තමන් වෙත කැඳවා ඒ ඒ අයගේ දුග්ගහීත වැරැදි තැන් පෙන්වා දී සදොස් තැන් නිදොස් කළ සේක. මේවා මෙසේ නිදොස් කොට සත්‍යය ඇති සැටියෙන් ස්ථාවර කරන්නට පුළුවන් වූයේ වැරැදි වැරැදි සේ හඳුනා ගන්නට සමත් අන් ශ්‍රාවකයින් බොදු පිරිස් අතර සිටි නිසාත් ධර්මාධිපත්‍යයේ හිමිකරු වූ බුදුරදුන් වෙත වැරැදිකරුවන් ගෙන යෑමට සමත් භික්ෂූන් සිටි නිසාත් ය. සම්බුද්ධ පරිනිර්වාණයට අනතුරුවත් මේ ධර්ම ප්‍රාමාණ්‍යයම ක්‍රියාත්මක වූ බව සාසන ඉතිහාසයෙහි දක්නට ලැබේ. එය එසේ කළ හැකි බව ද මහා පරිනිබ්බාන සූත්‍රයේ සතර මහා පදෙස දේශනාවෙන් පැහැදිලි වේ.

තත්ත්වය මෙසේ වෙතත් එදා සිට අද දක්වා සාසන ඉතිහාසය හා බෞද්ධ සාහිත්‍යය දෙස බලන කල එය තුළට ඇදහිය නොහැකි තරම් විපරීත ප්‍රතිවිරුද්ධ අදහස් කාගේ කාගේත් නොසැලකිල්ල නිසාත් නොදැනුවත් ව හෝ දෙනු ලබන සහාය නිසාත් ඇතුළත් කර ගෙන ඇති බව පැහැදිලිව පෙනේ.

පෙළ හා අටුවා යන දෙතන්හි ම මෙබඳු තැන් බහුල ව දැක ඇති නමුත් මෙහි දී අපගේ විමසුම ඉතා සීමිත ව කිරීම අපේ බලාපොරොත්තුවයි. මූලික වශයෙන් එය ධර්ම විනය යන දෙකට ම සම්බන්ධයි. අපගේ මාතෘකාව නම් ථේරවාද බෞද්ධ සම්ප්‍රදාය තුළ භික්ෂුවකට සියදිවි පරිත්‍යාග කිරීම පාදකවන කිසියම් ක්‍රියා මාර්ගයකට බැස ගැනීමට අවසර තිබේ ද? අපට නම් මෙය පෙනෙනුයේ ඉතා උග්‍ර ප්‍රශ්නයක් ලෙසයි. ජීවිතය තමන්ගේ වුව ද අනුන්ගේ වුව ද එය නැසීමට දරන ප්‍රයත්නය ධර්මය අතින් ගෙනහැර බැලුවොත් පන්සිල් පද පහේ පළමු වැන්න වන පාණාතිපාතා වේරමණී යන්නට අභියෝගයකි. මෙම සික පදයෙන් ඉස්මතු කරන පර පණ

නැසීමෙන් වැළකීම නැතහොත් විරතියත් සමග ම සබ්බපාණභූත හිතානු කම්පී යන ප්‍රවර්ධක ගුණය ගම්‍යවෙයි. එහෙයින් බුදු සමය වැනි ධර්මානුගත ව සැකසුනු චින්තනයක් තුළ සත්ත්ව ඝාතනය නැතහොත් ජීවිත වැනසීම මනසේ උසස් බවක් උරුම කොට ඇති (මනස්ස උස්සන්නතාය මනුස්සා) කාහට වත් ගිහි පැවිදි භේදයක් නැතිව නොහොබී. බුදු සමයේ පරමාර්ථය වූ නිවන කරා යෑම සඳහා සැකසුනු ත්‍රිවිධ ශික්ෂාවේ (තිස්සො සික්ඛා) මූලික අදියර වූ සීල කොටසෙහි මුල් ම සිකපදය පරපණ නැසීම සඳහා යොදා ඇති බව අමතක නොකටයුතු ම ය. පර පණ යන යෙදුම අප අතර ප්‍රචලිත වුව ද මෙයට තම පණත් ඇතුළත් බව අපගේ හැඟීමයි. දහමෙන් ද මෙය පැහැදිලි වන බව අත්තානං උපමං කත්වා න හනෙය්‍ය න ඝාතයෙ වැනි යෙදුම්වලින් ද ස්ඵුට වෙයි. සීලය තුළින් නිවන කරා යෑමටත් අවශ්‍ය මේ ශික්ෂණය හුදෙක් ධර්ම විනය දෙකොටසේ ධර්මය තුළින් ම සිදුවන බව අවධානයෙන් සිහි කරන්න. බෞද්ධයන් මෙන් ගිහි පැවිදි වශයෙන් කොයි තරාතිරමේ වුවත් මේවා පිළිබඳ ධර්මානුගත උපදෙස් දැනගෙන සිටිය යුතු ය. ක්‍රියාවට නැංවිය යුතු ය. සුත්ත නිපාතයේ ධම්මික සූත්‍රයේ ප්‍රාණඝාත සාධක අංග තුනක් දැක්වෙන අයුරු අමතක නොකරන්න.

> පාණං න හානෙ න ච ඝාතයෙය්‍ය
> නචානුජඤ්ඤා හනතං පරෙසං

සු.නි.ධම්මික සූත්‍රය

තමන් පරපණ නොනසන්නේ අනුන් ලවා වත් එය නොකරවයි. එසේ ම අනුන් විසින් කෙරෙන පර පණ නැසීම අනුමත නොකරයි. මානව සදාචාරය පිළිබඳ මනා දැනුමක් ඇතිව ජීවත්වනු කැමැති ලෝකයේ අබෞද්ධ බොහෝදෙනා මේ බණ පදය මුළුමනින් ම පිළිගැනීමත් දැන් ලෝක ව්‍යාප්ත අහිංසාවාදයන් ගෙන යත්. ඔවුහු මත්ස්‍ය මාංස වශයෙන් සතුන් ආහාරයට නොගන්නවා පමණක් නොව සතුන්ගේ හම් ලෝමාදිය යොදා පිළියෙල කළ ඇඳුම් පැළඳුම් ද ප්‍රතික්ෂේප කරති.

දේවවාදී ඇතැම් ආගම් ද දැන් බෞද්ධයින්ට වඩා මේ ධර්මය පිළිගනිති. මේ අතර බෞද්ධ භික්ෂූන් බුදුරදුන් සතුන්ගේ මස් කෑම තහනම් කළේ කොතැන දැයි සොයමින් විචාර චාරිකාවල යෙදෙනවා දක්නට ලැබේ.

> සුඛිනෝවා ඛේමිනෝ හොන්තු
> සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යන බණ පදය තුළ රැඳෙමින් ඕනෑ තරම් මස් කෑමට කාගෙන් තහනමක් ද?

දැනට අවුරුදු දෙදහස් පන්සියයකටත් පෙර ලොවට බිහි වූ මෙවන් ධර්ම පර්යායක් තුළ තම පණ පර පණ වශයෙන් හෝ සත්ත්ව මිනිස් වශයෙන් හෝ භේදයක් බෞද්ධයින් අතර බිහිවූයේ කෙසේ ද යනු අපට ඇදහිය නොහැකි ප්‍රකාශයකි. බුදු දහම තුළින් බෞද්ධයාට හිමිවන එකම චින්තනය විශ්වය එක ම ජීව ලෝකයක් ලෙස සැලකීමයි. සුත්ත නිපාතයේ ගැබ්වී ඇති මෙත්ත සූත්‍රයේ සුඛිනොවා ඛෙමිනො හොන්තු යන සිවුවැනි ගාථාවේ සිට දිගට ම ඉදිරිපත් කෙරෙනුයේ ද විශ්වය පිළිබඳ ආකල්පයකි. සත්ත්ව ලෝකය ඔවුනොවුන්ගේ ශරීර ප්‍රමාණ වශයෙන් වත් සිටිනා තැන් වශයෙන් වත් කොටස් වලට නොබෙදා සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා යනුවෙන් පොදුවේ සැමගේ ම සෙත ශාන්තිය පැතීම බෞද්ධ ආගමික චින්තන රටාවයි.

මෙබඳු රටාවක් තුළ කිසිම ජීවිතයක් තමන්ගේ හෝ වේවා අනුන්ගේ හෝ වේවා දැන දැන (සංචිච්ච) විනාශ කිරීම නොගැළපෙන බව දැන් පැහැදිලි විය යුතු ය. බුදු සමය තුළ පූර්ණ වූ ප්‍රාණඝාත සංකල්පය මෙය යයි අපගේ පිළිගැනීමයි. මේ වූ කලී අප ධර්මය තුළින් බැසගත් චින්තනයයි.

දැන් අප ප්‍රාණඝාතය පිළිබඳ විනය පිටකය තුළින් දැක්වෙන ආකල්පය විමසා බැලීම වටී. ධර්මය තුළ භික්ෂුවගේ චර්යා ධර්ම පිළිබඳ කියැවෙන සියලු අදහස් නීති ගත කොට ඒවා උල්ලංගනය කිරීමේ දී සුදුසු පරිදි ඒවාට දඬුවම් නියම කිරීම හා ඒවා ක්‍රියාත්මක කරවීම විනය

පිටකයේ බලාපොරොත්තුවයි. එසේ කිරීමේ දී සවාදාරාත්මක අතින් ප්‍රමාණවත් දියුණු තත්ත්වයකට පත්වූ රාජ්‍ය පාලන තන්ත්‍ර තිබූ භාරතයේ රාජ්‍ය නීති සංග්‍රහය පිළිබඳව ද බුදුරදුන්ට සැලකිලිමත් වීම අවශ්‍යාවිය. එබැවින් ප්‍රාණඝාතය ධර්මය අතින් භේදයන්ගෙන් තොර ව්‍යාපාද විහිංසා ගණයට වැටෙන අකුශලයක් වුව ද විනය අතින් දඬුවම් පැමිණවීමේ දී රජයේ නීති මාලාව හා සැසඳිය හැකි තත්ත්වයකින් එය තිබිය යුතු බව පැහැදිලි විය. එහෙයින් ප්‍රාණ ඝාතය මිනිස් ඝාතනය සත්ත්ව ඝාතනය වශයෙන් කොටස් දෙකකට බෙදිණ. රජයේ නීතිය අනුගමනය කරමින් මිනිස් ඝාතනය සඳහා පාරාජිකා නම් වූ සසුනෙන් බැහැර කිරීමේ උපරිම දඬුවම පැණවීම ගැන කිසි ම ප්‍රශ්නයක් නොවීය. මේ වූකලී තුන්වැනි පාරාජිකාව වූ මනුස්ස විග්ගහ සික පදයයි.

එහෙත් ප්‍රාණඝාතය සාකල්‍යයෙන් ම හෙළාදකින බුදු සමය සත්ත්ව ඝාතනයේ සදොස් බව අමතක නොකළේ ය. 61 වැනි පාචිත්තිය සික පදය යටතේ යො පන භික්ඛු සංචිච්ච පාණං ජීවිතාවොරෙපෙය්‍යා පාචිත්තියං යනුවෙන් සතුන් මැරීම සඳහා අඩු ප්‍රමාණයේ දඬුවමක් නියම කොට ඇත. නීතිමය අතින් මේ ප්‍රභේදය සැලකිය යුත්තක් ව තිබුණත් ධර්මය අතින් එය භික්ෂු ජීවිතයට නොහොබිනා හෙයින් භික්ෂුවකට තම උපසම්පදාවෙහි දී හඳුන්වා දෙන චත්තාරි අකරණීයානි යටතේ ප්‍රාණ ඝාතය මිනිස් හෝ සත්ත්ව යන කොයි ගණයට වැටුණත් උපසපන් භික්ෂුවක් විසින් නොකට යුත්තක් ලෙස ස්ථිරවම තීරණය කොට ඇත. 11 වැනි පාචිත්තිය සික පදය වන භූතගාම පාතව්‍යතාය පාචිත්තියං යන්න යටතේ සාක ලෝකය ද මේ ප්‍රාණඝාතයට ආබද්ධකර තිබීම සැලකිල්ලට භාජනය විය යුතු ය. භූතගාමපාතව්‍යතාය පාචිත්තියං යන මේ 11 වැනි පාචිත්තිය සිකපද යෙහි කියැවෙන පරිදි ගස් වැල් ආදිය ද ඇතුළුව මිනිස් සත්ත්ව ආදී කිසිම කොටසකට ජීවිත විනාශයක් කිරීම උපසම්පන්න භික්ෂුවකට නොහොබිනා බව විශේෂයෙන් විනය පිටකයෙන් ලැබෙන නිර්දේශයයි. තත්ත්වය මෙසේ තිබිය දී තමන්ගේ හෝ වේවා අනුන්ගේ හෝ වේවා ජීවිතයට කරන හානිය දෙස එක සේ බැලිය යුතු යනු අපගේ හැඟීමයි.

සිංහල සාහිත්‍යය අපගේ විශේෂ අධ්‍යයන අංශය නොවේ. එහෙත් විනය කරුණු පිළිබඳ විමසීමක දී දස වැනි සියවසෙහි දී අනුරාධපුර යුගය අවසානයේ දී පමණ ලියැවුණු සිංහල ග්‍රන්ථයක භික්ෂුවක් තම ජීවිතය නසාගනී නම් නැතහොත් නසවාගනී නම් දුකුලාවේ යන කියමනක් දුටිමි. මේ ග්‍රන්ථය නම් සිඛවලඳ විනිසයි. ඒ පාඨය මෙසේ ය. මියැටි සිතින් තමා මරා නම් දුකුළාවේ. අනුන් ලවා තමා මරවා නම් දුකුළා වේ.

ප්‍රාණඝාතය පිළිබඳ අප දැන සිටින බෞද්ධ අදහස්වලට මෙය හාත්පසින් ම ප්‍රතිවිරුද්ධ සේ පෙනෙයි. මෙහි සදොස් බවක් අපට වැටහිණ. උපසපන් භික්ෂුවක් කරන හෝ ඔහු අතින් කෙරෙන මිනිස් ඝාතනය දෙසට අපි අවධානය යොමු කෙළෙමු. එහි මනුස්ස විග්ගහ යන තුන්වැනි පාරාජිකා සික පදය යටතේ එන අනු ප්‍රඥප්තියක් මෙසේ ය. න ච භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං යො පාතෙය්‍ය ආපත්ති දුක්කටසස.

මේ අනුප්‍රඥප්තිය පැනවීමට හේතුව මෙසේ ය. වරක් එක් භික්ෂුවක් තමාගේ මහණ දම් සාර්ථක ලෙස කිරීමට නොහැකි කවූයේ සිය දිවි නසා ගැනීමේ අටියෙන් ගිජුකුළු පව්වට නැග එහි සිට ප්‍රපාතයට පැන්නේ ය. එසේ පැන්න ඔහු පහල යම් කිසි වැඩක යෙදී සිටි මිනිසකුගේ හිස මත වැටීම නිසා ඒ මිනිසා මරුමුවට පත්විය. මිනිසෙකු මැරීමේ පාරාජිකා වරදට තමා පත්වූයේ ද යන සැකයෙන් ඒ පිළිබඳව බුදුරදුන්ගෙන් විමසූ කල එය නොසිතා සිදුවූ දෙයක් හෙයින් එසේ නොවන බවත් ඒ වරද දුක්කට නොහොත් දුකුළා ගණයට වැටෙන බවත් වදාරා මෙයට ආබද්ධ කොට ඉහත දැක්වූ න ච භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං යන අනුප්‍රඥප්තිය පැනවූ සේක. අප දන්නා තරමින් මෙහි සිංහල තේරුම ඉදිරිපත් කරත හොත් මහණෙනි (ගස් ගල් ආදි උඩක සිට) බිමට නොපැනිය යුතුයි. යනුයි. පාතෙතබ්බං යන පදය සෑදී ඇත්තේ පාළි පත් ධාතුවේ ප්‍රයෝජ්‍ය ක්‍රියා රූපය වූ පාතෙති යන්නට - තබ්බ යන්න යෙදීමෙනි. පතති -වැටෙයි පාතෙති-වට්ටවයි. වැටෙන්නට සලසයි. වැටෙන්නට සලසයි යන්නයි. (උඩක සිට බිමට) පනියි යන අරුත ගැබ්වී ඇති බව අමුතුවෙන් කිවමනා නොවේ.

මෙසේ හෙයින් පාතෙතබ්බ යන පදයෙහි මැරීම් හෝ මරවා ගැනීම් අර්ථයක් කිසි සේත් විද්‍යමාන නොවන බව අපගේ හැඟීමයි. පත් ධාතුවෙන් මැරීම් මැරවීම් අරුත ලබනුයේ එයට පූර්ව අති යන උපසර්ගය පාතෙති යන ප්‍රයෝජ්‍ය ක්‍රියාරූපයට යෙදීමෙනි. යො පාණං අතිපාතෙති, පාණාතිපාතා වෙරමණී යන තැන් විමසා බලන්න.

මෙහි දැක්වූ න ච භික්ඛවේ අත්තානං පාතෙතබ්බං යන යෙදුමෙහි පණ නැසීමක් කිසිසේත් නොකියවෙන බව අපි තරයේ ම කියා සිටිමු. මින් විනය අනුප්‍රඥප්තිය යටතේ තහනම් කරනු ලැබුයේ එදා ඒ භික්ෂුව කළා වූ ගිජුකුළු පව්වේ සිට පැනීම වැනි අවිචාර හැසිරීම් ය. සිඛවලඳ විනිස 10 වැනි සිය වසෙහි දී මේ වැරැදි අර්ථකථනය ලබා ගත්තේ අනිවාර්‍යයෙන් ම පාරාජිකා පාළියේ මේ අනු ප්‍රඥප්තිය පිළිබඳ වැරැදි සිංහල පරිවර්තනයකිනැයි අපි තීරණය කරමු. එතැන් සිට මේ සදොස් අර්ථකථනය සිංහලෙන් ලියැවුණු විනය සාහිත්‍යයට ද ගලා අවුත් ඇත. බුරුමයේ අදත් මේ වැරැදි මතය දරන බව ආරංචි මාත්‍රයෙන් දනිමු. කාගෙන් කාට මෙය බෝවුණා දැයි අපි තවම නොදනිමු. අප දැනට දන්නා තරමට තායිලන්තය (සියම් රට) මේ වරදට අසුවී නැත.

ලක්දිව ඉහල ම පෙළේ වැජඹෙන බුද්ධ ජයන්ති ග්‍රන්ථ මාලාවේ පාරාජිකා පාලියෙහි අප සදොස් යයි දන්නා පරිවර්තනයක ලියැවී ඇත්තේ මෙසේ ය.

මහණෙනි ආත්ම ඝාතනය නොකටයුතුයි. යමෙක් ආත්ම ඝාතනය කෙරේනම් දුකුළා ඇවැත්වේ. ( පාරාජිකා පාළි 1-181 පිට)

න ච භික්ඛවෙ අත්තානං පාතෙතබ්බං යො පාතෙය්‍ය ආපත්ති දුක්කටස්ස යන පාළි පාඨය ඉහත කී පරිදි පරිවර්තනය කිරීම මුළුමනින් ම වැරැදි බව අපගේ හැඟීමයි. ධර්මය හා විනය සමග සසඳා බැලීමේ දී මෙහි දැක්වෙන ආත්ම ඝාතන අදහස පිළිගත නොහැකි විපර්යාසයකි.

ශාසන ඉතිහාසය තුළ ගොධික, වක්කලී හා ඡන්න නම් වූ භික්ෂූන් වහන්සේලා තුන් නමක් සිය දිවි නසා ගත් පුවත් සංයුක්ත නිකායේ දක්නට ලැබේ. මේ තිදෙනා වහන්සේ ම බුද්ධකාලීන වූත් රහත් බැවින් තම ජීවිත අවසානය දුටුවාවූත් මහ රහතන් වහන්සේලා ය. බුදුරදුන් ඉතා ආසන්න ව ඇසුරු කළ අය ය. නිවන අරමුණු කරගත් සුපේශල බුද්ධ පුත්‍රයෝ ය. මුන්වහන්සේලා අතුරෙන් ගොධික හිමියෝ හය වරක් ම අප්‍රමාදව (අප්පමත්තො), වීර්‍යයෙන් යුක්ත ව (ආතාපී), අධිෂ්ඨාන ශීලීව උත්සාහ කරන්නේ (පහිතත්තො) සීමිත වූ විමුක්තියකට (සාමායික චෙතො විමුක්ති) පත්විය. එහෙත් තමා පෙළමින් සිටි කායික ආබාධයක් නිසා හයවරක් ම ඒ විමුක්තිය රඳාගත නොහැකි විය. ඉන් පිරිහී ගියේ ය. (සංයුක්ත නිකායේ මාර සංයුක්තය බලන්න). ගොධික තෙරණුවෝ සැණකින් සිය ගෙල සිඳගෙන ජීවිත අවසානයට පත්වූයේ හත්වන වරට ඉහත කී විමුක්තිය ලබාගෙන එහි රැඳී සිටින අතරේ ය. එහෙයින් ගොධික තෙරණුවන් ජීවිත අවසානයට පත් වූයේ තමා ලත් ඒ විමුක්තිය තුළ බවත් එහෙයින් නැවත නූපදින බවත් ඉහත කී විස්තරයේ කියැවේ. වක්කලී හා ඡන්න යන දෙනමගේ සියදිවි නසා ගැනීම් පිළිබඳ විස්තර මෙම ස්වරූපය ම ගනී. උන්වහන්සේලා ඒ සිද්ධිය වන විට නැවත සසර නූපදවින තත්ත්වයකට පැමිණ සිටි බවත් මේ ජීවිත කාලය තුළ තවදුරටත් ජීවත්වීමේ රුචියක් උන්වහන්සේලා තුළ නැති බවත් ප්‍රත්‍යක්ෂ වේ. මේ කථා තුනෙන් ම කියැවෙන්නේ එකී තෙරවරුන් නැවත භවයක නූපදින නිසා උන්වහන්සේලා අතින් සිදු වී යයි කියවෙන ඒ කර්මයේ විපාක එලදීමක් සිදු නොවන බවයි. අංගුලිමාල තෙරුන්ගේ කථාවේ මෙන් මේ වා අහෝසි කර්ම ගණයට වැටෙනවා යනු අපගේ හැඟීමයි.

මේ සිය දිවි නසා ගැනීමේ ආකල්පයට සමාන වූ දෙපලක් මෙසේ ථෙර ගාථාවේත් (ථෙර ගාථා 407-410) ථෙරී ගාථාවේත් (ථෙරී ගාථා 77-81) සඳහන් වේ.

සප්පදාස ථෙරණුවෝ විසි පස් වසක් මහණදම් පුරා කිසිදු අධිසමයක් නොලද්දේ පැවිදි බව අත්හැර ගිහි බවට පෙරළෙනවාට වඩා ගෙල සිඳ සියදිවි නසා ගැනීම මැනවයි සිතී ය. මෙබඳු

සාපේක්ෂක චින්තනයක් මත රැඳී සැතක් ගෙන ගෙල සිඳ ගැනීමට තැත් කරද්දීම හේ රහත් බව ලැබී ය. හේ තම ගෙල සිඳීමට පෙර චිත්ත විමුක්තිය ලැබී ය.

සීහා තෙරිණිය ද සත් වසක් දුකසේ මහණ දම් පුරනුයේ කිසිදු අධිගමයක් නොලැබුවේ ගිහි බවට පෙරලෙනවාට වඩා ගසක එල්ලී සියදිවි නසා ගැනීම මැනවැයි සිතී ය. ඇය ද බෙල්ලේ ලණුව දමත් ම රහත් බව ලැබුවා ය.

මේ දෙක ම සාපේක්ෂක ඇගයීමක් විනා සියදිවි නසා ගැනීමේ අපේක්ෂාවක් නොදක්වයි. රහත් බව ලබා අනතුරුව ජීවත් වීමට ඔවුනට හැකිවිය.

අවසාන වශයෙන් අප කියනු කැමැත්තේ ලක්දිව බෞද්ධ අධ්‍යයන ක්ෂේත්‍රයේ දසවැනි සිය වසටත් පෙර ලක්දිව විනය පිටකයේ (පාරාජිකා පාළියෙහි) එන පාළි පාඨයක් වැරැදි ලෙස පරිවර්තනය වී ඇති බවයි. එහි එන පාළියේ (අත්තානං පාතෙතබ්බං) බස දෙස බැලුවත් ධර්මානුකූල අරුත දෙස බැලුවත් එයට ආත්ම ඝාතනය කියා අදහසක් ඉදිරිපත් නොකළ හැකියි යනු අපගේ ස්ථිර හැඟීමයි. මෙය නොපමාව නිදොස් කළ යුතු වරදකි.

මේ දුග්‍රාහය නිසා තමා සෝවාන් බවට පත් වූ කෙනෙකැයි කියමින් සියදිවි නසාගත් විදේශ භික්ෂුවක් ගැන ලක්වැසියෝත් විදේශිකයෝත් දනිති. මේවා තණකොළවලින් වසා දැමිය යුතු හෝ වසා දැමිය හැකි හෝ වැරැදි යයි අපි නොසිතමු. ඨපෙත්වා චුල්ල වජ්ජං ඨපෙත්වා ගිහිස පටිසංයුත්තං යන විනය නිර්දේශ අමතක නොකරන්න.

ලක්දිවට දැන් බෝවීගෙන එන උපසපන් භික්ෂූන් අතින් සිදු කෙරෙන මරණාන්තික උපවාස ගැන කිව යුත්තේ ද මෙය ම ය.

චිරං තිට්ඨතු සද්ධම්මෝ ලෝකො හෝතු සුඛී සදා.